# තොප්පිගල පුරාවිද්‍යා භූමිය සඳහා උරුම කළමනාකරණ සැලැස්මක්

කෙසෙල්පොත විමලධම්ම හිමි

පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, keselpothawimala@gmail.com

ප්‍රමුඛ පද : ඓතිහාසික තොප්පිගල පුදබිම, බෞද්ධ උරුමය, උරුම කළමනාකරන ගැටලු, උරුම කළමනාකරන යොජනා.

## හැඳින්වීම

අතීත මානවයාගේ ක්‍රියාකාරිත්වයෙන් ශේෂ වූ ද්‍රව්‍යමය සාධක පුරාවිද්‍යාත්මක උරුමය යන්නෙන් සරල ව අර්ථ දැක්වේ. එයට චංචල හා නිශ්චල මෙන් ම ස්පර්ෂ කළ හැකි හා ස්පර්ශ කළ නොහැකි උරුමය අයත් වේ. ශ්‍රී ලාංකේය පුරාවිද්‍යාත්මක ශික්ෂණයේ පූර්ව අවස්ථාවේ දී උරුමය හෝ විෂය ක්ෂේත්‍රය වර්ගීකරණයකට ලක් නොවේ. සමාජීය අවශ්‍යතාවය මත පසුකාලීනව විෂය ක්ෂේත්‍රය වර්ධනය වීමත් සමඟ ප්‍රාග් ඓතිහාසික පුරාවිද්‍යාව, පූර්ව ඓතිහාසික පුරාවිද්‍යාව, සමුද්‍ර පුරාවිද්‍යාව, නානකවිද්‍යාව, පාරසරික පුරාවිද්‍යාව ආදී බහුවිධ විෂය ක්ෂේත්‍ර ගණනාවකින් පෝෂණය විය. ඒ අනුව වර්තමානයේ බෞද්ධ ස්මාරක හා ස්ථාන ආශ්‍රිත උරුමය අපට බෞද්ධ උරුමය ලෙස සරල ව අර්ථ දැක්විය හැකි ය. එකී බෞද්ධ උරුමය වර්තමානය වන විට දැඩි උරුම සංහාරයක් දක්වා වර්ධනය වීම ඛේදණීය තත්ත්වයකි. ඊට ආසන්නත ම සාධකය නැගෙනහිර පළාතේ බෞද්ධ උරුම සංහාරය තුළින් පෙන්වා දිය හැකි ය. ඉ පැරණි රුහුණු රාජධානියට අයත් ව තිබෙන වර්තමාන නැගෙනහිර පළාතේ අනුරාධපුර යුගයේ මුල් අවධියේ සිට විවිධ ඓතිහාසික අවධි වලට අයත් ස්මාරක හා ස්ථාන විශාල වශයෙන් දක්නට ලැබේ. එහිදී වැදගත් ස්ථානයක් ඓතිහාසික තොප්පිගල පුදබිමට හිමිවේ.

ශ්‍රී ලංකාව සතු බෞද්ධ උරුමය පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී බොහෝ දෙනෙකුගේ අවධානය රජරට ශිෂ්ටාචාරයට පමණක් සීමා වේ. විශේෂයෙන් ම දශක තුනකට අධික කාලයක සිට යුධමය වාතාවරණයක් පැවති නැගෙනහිර පළාත පිළිබඳ ව වර්තමානයේ වුවද අදාළ බලධාරීන් අවධානය යොමු කරනු ලබන්නේ ඉතා ම අල්ප වශයෙනි. තොප්පිගල හෙවත් Barons Cap ඉපැරණි රුහුණු රාජධානියට හෙවත් වර්තමාන නැගෙනහිර පළාතට අයත් වේ. මඩකලපුව සිට වාලච්චේන දක්වා දිවෙන ප්‍රධාන මාර්ගයේ කි.මී. 12ක් දුරින් කිරාන් හන්දිය හමුවන අතර කිරාන් හන්දියෙන් වමට හැරී කි.මී. 20ක් පමණ උතුරු දිසාවට ගමන් කළ විට බටහිරින් මාදුරුඔය ජාතික වනෝද්‍යානයට හා දකුණු දෙසින් ඔටුනුගල රක්ෂිතයෙන් මායිම්ව පිහිටි තොප්පිගල පුදබිම හමුවේ. අක්කර 250 ක පමණ භූමි භාගයක පිහිටි මෙම ආරාම සංකීර්ණයෙහි කටාරම් සහිත ලෙන්, ඉදිකිරීම් අවශේෂ, හින්දු කලා නිර්මාණ, බෞද්ධ වාස්තුවිද්‍යාත්මකාංග, සෙල්ලිපි ආදි සංස්කෘතික උරුමය මෙන්ම ''මොනැඩ්නොක්ස්'' නම් භූ ලක්ෂණය හා ස්වාභාවික වෘක්ෂලතා ආදී ස්වාභාවික උරුමය ද දැකගත හැකිය. ඒ අනුව මෙම ප්‍රදේශය සංස්කෘතික හා ස්වභාවික උරුම එකතුවක පිළිබිඹුවක් ලෙස දැක්වීම වඩාත් නිවරදි ය. ඒ අනුව මේ පර්යේෂණය

මඟින් නැගෙනහිර පළාතේ ඓතිහාසික බෞද්ධ උරුම සංකීර්ණයක් ලෙස සැලකෙන තොප්පිගල හෙවත් **කළකමහ වෙහෙර** (සද්ධානන්ද හිමි, අමරසේකර 2016:01) ආශ්‍රිත ප්‍රදේශයේ බෞද්ධ උරුමය සුරක්ෂිත කිරීම සඳහා නව යෝජනාවලියක් ඉදිරිපත් කිරීමට අපේක්ෂිතය. දසක තුනකට ආසන්න කාලයක් පැවති යුදමය වාතාවරණය මේ වන විට අවසන් වී තිබුණ ද එම ප්‍රදේශයට අයත් ඓතිහාසික උරුමය සුරක්ෂිත කිරීමට අදාළ සැලසුම් මේ වනවිට සකස් වී නොමැත. ඒ හා සම්බන්ධ අවකාශය හා අභියෝග හඳුනාගැනීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වේ. පර්යේෂණ කලාපයේ දේශපාලනික, ආගමික, ආර්ථික, සාමාජික හා සංස්කෘතික සන්දර්භය අධ්‍යයනය කරමින් නව උරුම කළමනාකරන සැලසුමක් සැකසීම සඳහා උත්සාහ කිරීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වේ.

**ක්‍රමවේදය**

පූර්ව පර්යේෂණ, පුස්තකාල ගවේෂණය, සිතියම්, සැලසුම්, වාර්තා යනාදී සාහිත්‍ය මූලාශ්‍රය පරිශීලනයෙන් පසු ව පුරාවිද්‍යා පර්යේෂණවල දත්ත රැස්කිරීම හා විශ්ලේෂණයට යොදාගනු ලබන නිරීක්ෂණ, සහභාගිත්ව නිරීක්ෂණය, සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නාවලි, කේවල අධ්‍යයනා දී පර්යේෂණ ක්‍රමවේද මේ සඳහා යොදා ගන්නා ලදි.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

**උරුම සංරක්ෂණ ගැටලු** :-

ඓතිහාසික, කලාත්මක හා සෞන්දර්යාත්මක, භාවිතමය, සමාජමය මෙන් ම විද්‍යාත්මක හා ආර්ථිකමය ආදී විවිධ වූ අගයන්ගෙන් යුක්ත මෙම ප්‍රදේශයේ වර්තමාන තත්ත්වය පිළිබඳව අපට කිසිදු ආකාරයකට සතුටු වීමේ හැකියාවක් නොමැත. ඊට ප්‍රධාන හේතුව ඓතිහාසික අවධි ගණනාවක අගයන් සහිත මෙම ප්‍රදේශයේ පුරාවිද්‍යාත්මක බෞද්ධ උරුමය සංරක්ෂණය කිරීම සඳහා කිසිවකුගේ අවධානය යොමු නොවීමයි.

දශක තුනකට අධික කාලයක් මෙම ප්‍රදේශයේ පැවති යුධමය වාතාවරණය නිමාවට පත්ව තිබුණ ද කලාපයේ සිදුවන සංවර්ධනයට සමගාමීව බෞද්ධ උරුමය සංරක්ෂණය කිරීම සඳහා විධිමත් වැඩපිළිවලක් දක්නට නොලැබේ. ඒ අනුව වර්තමානයේ මෙම ස්ථානයේ දක්නට ලැබෙන උරුම කළමනාකරන ගැටලු බොහොමයක් හඳුනාගත හැකි ය.

- විධිමත් ලෙස පුරාවිද්‍යාත්මක පර්යේෂණ, ගවේෂණ සිදු නොවීම
- බෞද්ධ උරුමය ලේඛනගත නොකිරීම
- දශක තුනක් පුරා පැවති යුදමය වාතාවරණය
- ආගම් හා ජාතිවාදී ගැටලු
- විධිමත් උරුම කළමනාකරන ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොකිරීම
- වගකිවයුතු බලධාරීන්ගේ අවධානය යොමු නොවීම
- උරුමය හඳුනා නොගැනීම
- ආරක්ෂක ප්‍රතිපත්තියක් අනුගමනය නොකිරීම
- සන්නිවේදන දුර්වලතා
- යටිතල පහසුකම් අංග සම්පූර්ණ නොවීම
- අර්ථනිරූපණ දුර්වලතා
- පුරාවිද්‍යා කාර්යාල හා නිලධාරීන් නොවීම

**උරුම කළමනාකරණ යෝජනා** :-

ශ්‍රී ලංකාවේ සෙසු බෞද්ධ ස්මාරක මෙන් ම නැගෙනහිර පළාතට අයත් ප්‍රදේශයේ

ද කඩිනමින් බෞද්ධ උරුමය සංරක්ෂණය කළ යුතු ය. කරුණු එසේ වුවත් සෙසු ස්ථානවලට සාපේක්ෂව මෙම ප්‍රදේශයේ උරුම සංරක්ෂණ සැලසුම් කලාපය හා මානව අවශ්‍යතා හා සන්දර්භය මනාව තේරුම් ගෙන සකස් විය යුතු ය. උරුමයන් ආරක්ෂා කිරීම සඳහා සකස් කරන සැලසුම් කිසිඳු ආකාරයක ජාතිවාදි හා ආගම්වාදි දෘෂ්ටියෙන් තොරවිය යුතු ය. එම ප්‍රතිපත්ති හුදෙක්ම පුරාවිද්‍යාත්මක දෘෂ්ටියෙන් පමණක් සංරක්ෂණය කළ යුතු ය. එසේ නොවන්නට විවිධ ජාතීන්ට අයත් පිරිස් බෞද්ධ උරුමයට වෛර කිරීම පාලනය කළ නොහැකිය.

මෙම ස්ථානය ඇසුරින් විධිමත් පුරාවිද්‍යාත්මක ගවේෂණයක් සිදුකළ යුතුව පවතී. මෙහි ඇති බෞද්ධ උරුමය සමාජගත කළ යුතුව පවතී. ආගම් හා ජාතිවාදි ගැටලු ඇති නොවන ලෙස මෙය කළමනාකරනය කළ යුතු ය. උදාහරණයක් ලෙස මේ ස්ථානයේ දැනටත් ද්‍රවිඩ ජනතාව දේවපූජා පවත්වනු ලබයි. එයට හානියක් සිදු නොකළ යුතු ය. ඔවුන් කාලයක් තිස්සේ පවත්වාගෙන ආ ආගමික වතාවත් ඔවුනට ඉදිරියටත් සිදුකිරීමට අවස්ථාව සලසා දිය යුතු ය. මෙහි ඇති උරුමය ආරක්ෂා කිරීම සඳහා විධිමත් උරුම කළමනාකරන ක්‍රියාවලියන් සිදුකළ යුතු ය. ඒ සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ඇතුලු වගකිවයුතු නිලධාරීන්ගේ පූර්ණ අවධානය යොමු කළ යුතුය. ගවේෂණ, කැණීම්, සංරක්ෂණ ආදි පුරාවිද්‍යාත්මක කාර්යයන් නිසියාකාරව සිදුකරගෙන යෑම සඳහා පුරාවිද්‍යා කාර්යාලයන් ඇති කළ යුතු ය. මෙම ස්ථානය සංචාරකයන් පැමිණෙන ස්ථානයක් බවට පත්කළ යුතුය. ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් වූ මහාමාර්ග පද්දති අලුත්වැඩියා කිරීම, ප්‍රවාහන පහසුකම් විදිමත් කිරිම, නවාතැන් පහසුකම් ඇති කිරීම, ආරක්ෂාව තහවුරු කිරීම, කඳු ශිඛරයට නඟින මාර්ගය පිළිසකර කිරීම, වැසිකිළි කැසිකිළි ඉදිකිරීම, ජල පහසුකම් ඇති කිරීම ආදිය සිදු කළ යුතු ය.

මෙම උරුම කළමනාකරන ගැටලු හා ගැටලු ඇතිවන සන්දර්භය හා අවකාශය හඳුනාගෙන ප්‍රධාන උරුම කළමනාකරන සැලසුමක් සකස් කළ යුතු ය. මෙම ක්‍රියාවලිය අදියර කිහිපයක් යටතේ සිදුකරන්නේ නම් එය වඩාත් යෝග්‍ය වේ. පළමුවෙන් ම වගකිවයුතු ආයතන මාර්ගයෙන් විධිමත් ගවේෂණයකට ලක්කොට උරුමය තහවුරු කිරීම කළ යුතු ය. දෙ වැනි අදියරේ දී ආයතන සහයෝගිතාවය ජාතික හා ජාත්‍යන්තර වශයෙන් ලබා ගැනීම කළ යුතු ය. මෙයට විශ්වවිද්‍යාල වල සහයෝගය ද ලබාගත හැකි ය. තෙ වැනි අදියර ලෙස නැගනහිර පළාත ආශ්‍රිත උරුමය සුරක්ෂිත කළ යුතු ය. එහිදී අභ්‍යන්තර උරුම පරිශ්‍රය මනාව සැකසීම සිදු කළ යුතු ය. සිව් වැනි අධියර යටතේ යටිතල පහසුකම් පූරණය කරමින් සංචාරක ආකර්ෂණයට සුදුසු පරිසරයක් ලෙස සමාජ ගත කිරීම සිදුකළ යුතු ය. මෙම ක්‍රියාවලිය විධිමත් කාලෝචිත උරුම කළමනාකරන ක්‍රියාවලියක් ලෙස සමාජගත වනු ඇත.

### ආශ්‍රිත ග්‍රන්ථ


මේධානන්ධ හිමි, එල්ලාවල. (2008) **සිංහල බෞද්ධ උරුමය**, ප්‍රාචීන පස්ස උත්තර පස්ස නැගෙනහිර පලාතේ හා උතුරු පළාතේ. දයාවංශ ජයකොඩි සමාගම. කොළඹ.

**ANCIENT CEYLON**. Journal of Department of Archaeology. Sri Lanka. July 2016.No. 25